මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය.
අංක 2A, නව නගරය,
කුණ්ඩසාලේ

# මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ උපදේශිකා තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමට අදාල තොරතුරු

මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය යටතේ කුණ්ඩසාලේ නව නගරයේ අංක 2A, ස්ථානයේ ආරම්භ කිරීමට නියමිත පළාත් ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ උපදේශිකා තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයවළුන්ගෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**තනතුර**

මුල් ළමාවිය සංවර්ධන උපදේශිකා (කොන්ත්‍රාත් පදනම මත)

**වයස**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වයස අවුරුදු 18 නොඅඩු වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු වේ.

**දීමනාව**

මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවන අතර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබයි. බඳවා ගැනීමෙන් මාස 06 ක් යන තුරු රු 20,000.00 දීමනාවක් ගෙවනු ලබන අතර පාලක කමිටුව මගින් වරින් වර දීමනාව සංශෝධනය කරනු ලබයි.

**සුදුසුකම්**

අ.පො. ස සාමාන්‍ය පෙල විභාගය සඳහා ගණිතය සහ මව් භාෂාව ඇතුලත්ව සම්මාන තුනක් සහිතව වැඩ හයක් සමත් විය යුතු වේ.

සහ

ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් හෝ රජයේ පිළිගන්නා ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

දෙමළ භාෂාව සහ පරිගණක භාවිතය පිළිබඳව හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලබයි

**වෘත්තීය සුදුසුකම්**

මුල් ළමාවිය සංවර්ධන ඒකකය විසින් පිළිගන්නා ආයතනයකින් ලබා ගන්නා ලද මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උපාධිය හෝ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාව, දෑ අවුරුදු උසස් සහතික පත්‍ර පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම.

**පළපුරුද්ද**

ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තිය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ ලියාපදිංචි මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක අඛණ්ඩව වර්ෂ 05 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**කායික සුදුසුකම්**

අයදුම්කාරිය මනා සහ විශිෂ්ඨ චරිතයකින් සහ තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් මනා කායික සහ මානසික සෞඛ්‍යතත්ත්වයකින් හෙබි තැනැත්තියක් විය යුතු වේ.

**වෙනත්**

අයදුම්කාරිය ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු වේ.

අයදුම්පත කැඳවන අවසන් දිනයට පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩව මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු වේ. ( සම්මුඛ පරීක්ෂණයේදී ග්‍රාම නිලධාරි සහතිකය මගින් සනාථ කළ යුතු වේ )

තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අයිත්ම සම්පූර්ණ කර තිබිය යුතු වේ. එමෙන්ම අයදුම්කරුවන් එම සුදුසුකම පිළිබඳ සහතික පත් සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් සහ සහතික කරන ලද පිටපත් සමගින් ඉදිරිපත් කළ යුතු වේ.

**අයදුම්පත්‍ර**

අයදුම්කරුවන් සියලු විස්තර සමඟ මෙහි සඳහන් ආකෘතියට සකස් කරන ලද අයදුම්පතක් අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පතහි පිටපතක් පළපුරුද්ද දැක්වෙන සහතිකවල සහතික කළ පිටපත් සමගින්. අධ්‍යක්ෂ, 2A, නව නගරය, කුණ්ඩසාල යන ලිපියනයට 2023/12/15 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවර මුල් ළමාවිය සංවර්ධන උපදේශිකා තනතුර සඳහා බඳවා ගැනීම යනුවෙන් සඳහන් කළ යුතු වේ.